සංගමයේ ගරු ජ්‍යෙෂ්ඨ පැවිදි අනුශාසක ලෙස, ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අග්ගමහා පණ්ඩිත අති පූජ්‍ය කොටුගොඩ ධම්මාවාස නාහම්පාණන්වහන්සේ ද, ගරු පැවිදි අනුශාසක ලෙස, ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත ත්‍රිපිටකවේදී පූජ්‍යපාද රණස්ගල්ලේ ඤාණවීර ස්වාමීන්ද්‍රයන්වහන්සේ ද මහ සභාව විසින් පත්කරගන්නා ලදී. නව නිලධාරී මණ්ඩලය පත්කිරීම සඳහා මෙත්සවිය වෙත ලැබී ඇති අයදුම් පත් අනුව නිලධාරීන් මණ්ඩලය වෙනුවෙන් ගරු සභාපති ලෙස මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා ද, උප සභාපති තනතුරු සඳහා දයානන්ද ඉලේපෙරුම සහ කෝසල එදිරිසිංහ යන මහත්වරුන්ගේ නම්ද, සම ලේකම් තනතුරු සඳහා පියල් චන්ද්‍රතුංග සහ මංජුල රණසිංහ යන මහත්වරුන්ගේ නම්ද, භාණ්ඩාගාරික තනතුර සඳහා සුරංග ලියනගේ මහතාද, උප භාණ්ඩාගාරික තනතුර සඳහා චේනුක ජයනාත් මහතාද, සංස්කාරක තනතුර සඳහා එම්. කේ. ප්‍රියන්ත මහතාද, කාරක සභික වරුන් ලෙස මාලන් කන්දගේ, මෙනුර ඩයස්, නුවන් පෙරේරා, හර්ෂ පෙරේරා, චමින්ද ඉන්දික, ජගත් ප්‍රසන්න යන මහත්වරුන්ද තෝරා පත් කරගැනීමට යෝජනා විය. තවද වෙබ් හා මාධ්‍ය කමිටුවේ සභාපතිත්වය සඳහා චින්තක බණ්ඩාර මහතාද, දාන - සීල - භාවනා කමිටුවේ සභාපතිත්වය සඳහා යසින්ත රෂාන් මහතාද, පර්යේෂණ කමිටුව පිහිටුවා එහි සභාපතිත්වය සඳහා චින්තක බණ්ඩාර මහතාද, සුභසාධන කමිටුවේ සභාපතිත්වය සඳහා සුනිල් හේවාවසම් මහතාද යන ලෙස නම් යෝජනා කරන ලදී. එම සියළු නිලධාරී පත්කිරීම් සභා සම්මත කිරීම සඳහා චමින්ද ඉන්දික මහතා යෝජනා කල අතර සුනිල් හේවාවසම් මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී. 2019 - 2020 මීලග වර්ෂය සඳහා විගණන වරුන් ලෙස MKJ Associate ආයතනය තෝරාපත් කරගැනීමට මංජුල රණසිංහ මහතා යෝජනා කල අතර එම යෝජනාව චමින්ද ඉන්දික මහතා ස්ථිර කරන ලදී. 2019 - 2020 මීලග වර්ෂය සඳහා සමාගම් ලේකම් තනතුර සඳහා රොබට් හේවගේ මහතා තෝරාපත් කරගැනීමට කෝසල එදිරිසිංහ මහතා යෝජනා කල අතර එම යෝජනාව මාලන් කන්දගේ මහතා ස්ථිර කරන ලදී. ඉන් අනතුරුව මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් මෙත්සවිය 16 වන වාර්ෂික මහා සමුළුව සඳහා විවිධ ආකාරවලින් සහයෝගය දැක්වූ පිරිසට සහ ආයතන වලට සංසදයේ කෘතඥ පූර්වක ස්තූති ප්‍රකාශ කරමින් ස්තූති කතාව කිරීමෙන් අනතුරුව මෙත්සවිය 16 වන වාර්ෂික මහා සමුළුවේ වැඩකටයුතු නිමාවට පත් විය.

# දහසය වසරක මෙතෙක් අප ආ ගමන් මගෙහි

## නොමැකෙන පිය සටහන් වලින් බිඳක්... (2018/7 මස සිට 2019/3 මස දක්වා)

- 2018 ජුනි 03 දින - මෙත්සවිය 15 වන සංවත්සරය සහ මෛත්‍රී භූෂණ උපහාර 2018 ජුනි 03 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානවත්යෙන් පවත්වන ලදී. ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අග්ග මහා පණ්ඩිත කොටුගොඩ ධම්මාවාස නාහිමියන් උත්සවයේ මුලසුන දරන ලද අතර ගරු බුද්ධ ශාසන අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා ගෞරවනීය ආරාධිතයකු ලෙස උත්සවයට සහභාගිවිය.
- 2018 ජුනි 03 දින - දේශීය වෛද්‍ය විශාරද ශාසන කීර්ති ශ්‍රී විද්‍යාපති පූජ්‍යපාද මහඇලගම ලංකානන්ද ස්වාමින්ද්‍රයන් වහන්සේ මෛත්‍රී භූෂණ වෛද්‍ය චක්‍රවර්තී සම්මානයෙන් සහ දේශීය වෛද්‍යශූරී රුවින්ද මාරසිංහ මැතිදුන් මෛත්‍රී භූෂණ වෛද්‍ය ශිරෝමනි සම්මානයෙන්ද පිදුම් ලදහ. පොලිසිය තුල භාවනා වැඩසටහන් ඇරඹීමේ ක්‍රියාව අගයමින් ශ්‍රී ලංකා පොලිසියේ ගරු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා ශාසනදීපන ප්‍රජාප්‍රසෝධනි සම්මානයෙන් පිදුම් ලබන ලදී.
- 2018 ජුනි 03 දින - මෙත්සවිය ශිෂ්‍යත්ව ලාබී දරුවන්ද විශේෂ ත්‍යාග සහ ශිෂ්‍යත්ව පරිත්‍යාගයන් ශිෂ්‍යත්ව දායක පින්වතුන් අතින් ලද අතර මෙත්සවිය සංසදයේ වසර 15 පුරාවට නොකඩවා සාමාජිකත්වය පවත්වාගෙන ආ සාමාජිකයන් උපහාර සම්මානයෙන් පිදුම් ලබන ලදී. මෙත්සවිය මගින් සංවිධානය කරන ලද නායකත්ව පුහුණු වැඩසටහනට සහභාගිවුවන් හට සහතික පත්‍ර ප්‍රධානයද එදින සිදු කරන ලදී.
- 2018 අගෝස්තු 08 - අපවත්වී වදාල අති පූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේගේ තෙමස් පූර්ණය සිහිපත් කරමින් කොළඹ ජාතික රෝහලේ හෘද රෝග ඒකකයට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ පරිත්‍යාග කිරීම එම රෝහල් පරිශ්‍රයේදී රණස්ගල්ලේ ඤාණවීර සමින්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානවත්යෙන් සිදු කරන ලදී.
- 2018 අගෝස්තු 12 - මෙත්සවිය තරුණ කමිටුව මගින් කළුබෝඩ භාවනා මද්‍යස්ථානයට ප්‍රක්ෂේපණ තිරයක් (projector screen) පරිත්‍යාග කිරීම සිදු කරන ලදී.
- 2018 ඔක්තෝබර් 07 - නායකත්වය හා පුද්ගල සංවර්ධනය පිළිබඳ දේශනයක් ප්‍රදීප් යහම්පත් මහතා විසින් සිදු කරන ලදී.
- 2018 ඔක්තෝබර් 28 - මෙත්සවිය මගින් ඉදිකරන 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධප්‍රතිම වහන්සේගේ තැන්පත් කිරීම පිණිස පිරිවානා පොත් වහන්සේ තුල අඩංගු ධර්මය රන් පත්තිරුවල ලිවීම ආරම්භ කරන ලදී.
- 2018 නොවැම්බර් 04 - මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් කාල කළමනාකරණය සහ අරමුණු ජයගැනීමල පිළිබඳ විශේෂ දේශනයක් සිදු කරන ලදී.
- 2018 නොවැම්බර් 18 - 40 වන චිත්ත සංයම අභ්‍යාස සහ භාවනා පුහුණු වැඩසටහන ආරම්භය.
- 2018 දෙසැම්බර් 23 - මෙත්සවිය විසින් පාසල් අධ්‍යාපනය ලබන මහියංගනය ප්‍රදේශයේ අඩු අදායම් ලාභී දුවා දරුවන් 30 පමණ පිරිසක් වෙත ඔවුනට අධ්‍යාපන වර්ෂය සඳහා අවශ්‍ය බෑග්, සපත්තු ඇතුළු පාසල් ද්‍රව්‍ය ලබාදීම සිදු කරන ලදී.
- 2018 දෙසැම්බර් 23 - අබාධිත දරුවෙකු සඳහා රෝද පුටුවක් පරිත්‍යාග කිරීම සිදු කරන ලදී.
- 2019 ජනවාරි 01 - මෙත්සවිය මගින් වාර්ෂිකව සිදු කරන වසරේ ප්‍රථම හීල් දානමය පිංකම, ගරුතර මහා සංඝරත්නය උදෙසා කොළඹ හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී පවත්වන ලදී.
- 2019 ජනවාරි 01 - කොළඹ 07 ජයන්ති ළමා නිවාසයේ දරුවන් උදෙසා දහවල් දානමය පිං කම සිදු කරන ලදී. මෙහිදී මෙත්සවිය සාමාජිකයන්ගේ දායකත්වයෙන් දරුවන්ට අවශ්‍ය පාසල් බෑග්, සපත්තු, පොත් පත් සහ ත්‍රෛසිකල් ලබාදී දරුවන් සතුටු කිරීමට හැකි විය.
- 2019 ජනවාරි 01 - සවස සියළු මෙත්සවිය සාමාජිකයන්ට සෙත් පතා මෙත් බෝධි පූජාවක් වැල්ලවත්ත ශ්‍රී විජයාරමයේදී පවත්වන ලදී.
- 2019 ජනවාරි 06 - මෙත්සවිය මගින් සංවිධානය කරන මාසයේ පළමු ඉරුදින වැඩසටහන ඇස්වැද්දුමේ කමලසීල ස්වාමීන්වහන්සේගේ වැඩමවීමෙන් බොරැල්ල ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේදී පවත්වන ලදී.
- 2019 ජනවාරි 20 - මෙත්සවිය මගින් අබාධිත අය සඳහා පරිත්‍යාග කිරීම පිණිස රෝද පුටුවක් මහියංගන රජමහා විහාරයට පරිත්‍යාග කිරීම සිදු කරන ලදී.
- 2019 පෙබරවාරි 03 - මෙත්සවිය ත්‍රෛමාසික දාන-සීල-භාවනා වැඩසටහන බණ්ඩාරවෙල රත්මල්කන්ද භාවනා මද්‍යස්ථානයෙදී පවත්වන ලදී. ගරුතර මඩවල උපාලි නායක ස්වාමීන්වහන්සේගේ ප්‍රධානවත්යෙන් ඉතා අගනා ධර්ම දේශනා කිහිපයකින් සහ භාවනා පුහුණු වැඩසටහනකින් යුක්ත වූ මෙම වැඩසටහන මෙත්සවිය සාමාජිකයන් 200 ගේ පමණ සහභාගිත්වයෙන් සිදු කරන ලදී.
- 2019 මාර්තු 03 - මෙත්සවිය මගින් ඉගෙන ගන්නා දරුවන් වෙනුවෙන් සංවිධානය කරන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන ක්‍රම පිළිබඳ වන වැඩමුළුව මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් බොරැල්ල තරුණ බෞද්ධ සංගම් ශාලාවේදී (YMBA) පවත්වන ලදී.
- 2019 මාර්තු 24 - 41 වන චිත්ත සංයම අභ්‍යාස සහ භාවනා පුහුණු වැඩසටහන ආරම්භය.
- වසර පුරාම දිවයිනේ නන් දෙසින් අයදුම් කල ඉතා අඩු ආදායම් ලාභී සිසුන් 50කට පමණ මාසිකව ශිෂ්‍යත්ව මුදල් පිරිනමන ලදී

# තුති කුසුම්

**පහත වැඩසටහන් සඳහා ආධාර පරිත්‍යාග ලබා දුන් සුපිංවතුන් හට මේ කරගත්තා වූ කුසලය නිවන් දක්නා ජාති දක්වා ම ඔබ පසුපස එන සෙවනැල්ල සේ පවතීවායි ප්‍රාර්ථනා කරන්නෙමු !**

**මෙත් සවිය කාන්තා කමිටුව මගින් 2018 / 08 / 26 - 2019 / 05 / 26 දින දක්වා භාවනා වැඩසටහනට සහභාගී වන යෝගීන්හට ගිලන්පස / තේ පැන් සැපයීමේ පුණ්‍යකර්මයට දායකත්වය ලබා දුන් සුපින්වතුන්.**



**2018/08/26** : ගයනි ගමගේ මිය,
**2018/09/** : සජනි කුලසූරිය මිය,
වජිර පෙරේරා මිය,
ශිවන්ති ප්‍රනාන්දු මිය,
කේ. පී. නෙලිසිංහ මිය.
**2018/09/12** : සුගන්ධිකා පෙරේරා මිය,
පද්මා වීර බද්දන මිය,
සුනිල් හේවාවසම් මිය,
එස්.එම්.පී.ජේ. ලක්මාල් මයා,
සජීවනී මදනායක මිය,
එච්.එච්. ලාල් රවීන්ද්‍ර මයා,
ජයසිරි මයා,
චාමර මයා,
සුරනි ගොඩගේ මිය
**2018/09/19** : ඉන්ද්‍රාණි දොඩන්ගොඩ මිය,
**2018/09/26** : පද්මා වීරබැද්දන මිය,
අමල් බණ්ඩාර මයා,
සකුන්ත මයා,
සමන්ති ප්‍රියදර්ශනී මිය,
ලංකා පද්මිණී මිය,
උදේනි ප්‍රසංගනී මිය,
අයෝමි සංජානා මිය,
එච්. ඩබ්. පෙරේරා මයා,
බන්දුල ලක්ෂිත මයා,
කුමුදු රත්නායක මිය,
**2018/09/30** : තිලකා නිර්මාන්න මිය,
හේමමාලි මානවත්ත මිය,
රංජනී පෙරේරා මිය,
චම්පා මුතුමාලී මිය,
සංජීවනී මදනායක මිය,
ලාල් පුෂ්පකුමාර
විජිරා පෙරේරා

**2018/09/30** : තිලකා තිරිමාන්න මිය,
හේමමාලි මානවත්ත මිය,
රංජනී පෙරේරා මිය,
චම්පා මුතුමාලී මිය,
සංජීවනී මදනායක මිය,
ලාල් පුෂ්පකුමාර මයා,
වජිරා පෙරේරා මිය,
**2018/10/14** : ශලනි හීනටිගල මිය,
ඩී. සී. මාලනී පතිරණ මිය,
ශියාන් චාමර මයා,
ලක්ෂිකා පෙරේරා මිය,
හර්ෂනී සිංහපුර මිය,
අනෝමා බෝගොඩ මිය,
බන්දුල ලක්සිලු මයා
**2018/10/21** : අචිනි උත්පලා මිය,
අයෝමි සංජානා මිය,
තුෂාරි මිය,
ඩී. කොඩිතුවක්කු මයා,
ලක්සිරි සිල්වා
රමනී සෝමසේකර මිය,
ගයනි ගමගේ මිය.
**2018/10/28** : උදේනී මිය,
තුෂාරි මිය,
සන්ධ්‍යා ජයතුංග මිය,
අචිනි උත්පලා මිය,
**2018/11/11** : චේනුක ජයනාත් මයා
**2018/11/18** : සනත් අමරසේකර මයා,
සංජානා මිය,
අතුල නානායක්කාර මයා,
**2018/12/09** : බෙතේජු මිය,
ප්‍රභාෂනී අමරසිංහ මිය,
අප්සරා බොතේජු මිය,

**2018/12/16** : සම්පත් වෙදගෙදර මයා,
ආර්.ඒ.ඊ. රණතුංග මයා,
කුමුදුනී රම්‍යකාන්ති මිය,
රොෂාන් කුමාර මයා,
ගයනි දීපිකා මිය,
නන්දා ජයවර්ධන මිය,
අමල් බණ්ඩාර මයා,
සිම්ප්සන් තුසිත මයා,
පද්මා සේරසිංහ මිය,
සුනිල් හේවාවසම් මයා,
කවිදු විජේසිංහ මයා,
**2018/12/23** : අනිල් මෙන්ඩිස් මයා,
**2019/01/13** : සුවසෙත කමිටුව
**2019/01/27** : චින්තක බණ්ඩාර මයා,
**2019/02/10** : කේ. බී. ප්‍රේමවතී මිය,
**2019/02/17** : චතුර රෝහණ මයා,
චින්තක බණ්ඩාර මයා,
**2019/02/24** : පෙබරවාරි උපන්දින කාණ්ඩය
**2019/03/10** : සඳමාලි මිය
**2019/03/17** : මාර්තු, ජුනි උපන්දින කාණ්ඩය
**2019/03/24** : කාන්තා කමිටුව
**2019/03/31** : චින්තක බණ්ඩාර මයා,
**2019/04/21** : කාන්තා කමිටුව
**2019/04/28** : කාන්තා කමිටුව
**2019/05/05** : කාන්තා කමිටුව
**2019/05/12** : අශෝක ගාල්ලවත්ත
**2019/05/26** : සංදීපිකා මිය

## 2019. 04. 07 දින කොළඹ රිජ්වේ ළමා රෝහලෙට ආධාර ලබාදුන් සුපිංවතුන්ගේ නාමලේඛනය



| | |
|---|---|
| හර්ෂ පෙරේරා - | රෝද පුටු 6<br>වතුර ෆිල්ටර් 2<br>සහ වෛද්‍ය උපකරණ |
| නිරෝෂාන් පෙරේරා | 21,000/- |
| අචලා සෙව්වන්දි | 20,000/- |
| පෙබරවාරි කණ්ඩායම | 18,600/- |
| ආර්. ඒ. ඊ. රණතුංග | 18,000/- |
| ස්වර්ණා මාලිනි වික්‍රමසිංහ | 18,000/- |
| සිතුමි කරුදවල | 18,500/- |
| අමිල නාගසිංහ | 17,500/- |
| නාලක කුරේ | 17,500/- |
| ප්‍රේමාවතී ජයසිංහ | 1,000/- |
| ඩී. එල්. පී. අබේමැණිකේ | 500/- |

## තුති කුසුම්

**16 වන සංවත්සර උළලේ දී අපවත් වී වදාළ අතිපූජ්‍ය අහංගම ආනන්ද නාහිමිපාණන් ඇතුළු මෙත් සවිය මියගිය සාමජිකයින් වෙනුවෙන් සිදු කරන ලද සංඝගත දක්ෂිණාවට මුදලින් දායකත්වය ලබාදුන් සුපින්වතුන්**

| | | | |
|---|---|---|---|
| ස්වර්ණලතා විජේසිංහ | 10,000/- | කේ.ඩී.අයි.සි හෙට්ටිආරච්චි | 1,500/- |
| කේ.ඩී.අයි.සි හෙට්ටිආරච්චි | 5,000/- | ශෂිණි බණ්ඩාර | 1,000/- |
| අනෝමා පනාගොඩ | 5,000/- | ඉන්ද්‍රා මාලනි පෙරේරා | 1,000/- |
| බි.කොඩිතුවක්කු | 2,000/- | නුෂා මහත්මිය | 1,000/- |
| යසින්ත රෙෂාන් | 2,000/- | නිහාල් පුංචිහේවා | 1,000/- |
| දයානන්ද කොඩිතුවක්කු | 2,000/- | අයි.පි. මෙන්ඩිස් | 500/- |
| හේමමාලි මානවත්තගේ | 2,000/- | ශාන්ති ජයසේන | 500/- |
| සොයිසා මහතා | 1,700/- | චාමිකා සුබොධිනි | 500/- |
| අශෝකා ගාල්ලේවත්ත | 1,500/- | | |



## ගුරු පුදට මල් මිටක්

මහාචාර්ය චන්දන ජයරත්න මහතා,
මෙත්සවිය,
ශ්‍රී විජයාරාමය,
ෆෙඩ්රිකා පාර,
කොළඹ 06.

ගුරුතුමනි,

ඉහත ලිපිනයේ පදිංචි ප්‍රසාද් මියුරු සේනාධීර වන මම මෙත්සවියෙන් ලබා ගත් ධර්ම දැනුමට පළමුව පින්දෙමි. නොදන්නා කම නිසාම අන්ත අසරණ වෙන්නත්ද දිනෙන් දින වැඩි වෙනවා මිස අඩුවක් නැත. ඉතා අවිවේකයෙන් උනත් අප සැම වෙනුවෙන් කරන ධර්ම දානය සහ මග පෙන්වීම මෙන්ම දිරිගැන්වීට ඔබතුමාට පින් දෙමු. ධර්ම කරුණු මෙන්ම ජීවිතය සාර්ථක කරගැනීම පිණිස මෙත්සවියෙන් උගන්වන දේ තවත් ඇත.

මින් එකක්වන ලොකු බුද්ධ ප්‍රතිමා වහන්සයකට පැතුම් ඉටු කරගැනීමට කරන සුදුමල් පූජාව තවත් එකක්වන මුදල් ඉතිරියද අති සාර්ථක ක්‍රමයකි.

ඔබතුමා කියාදුන් පරිදි දිනකට රුපියල් 3 ඉතිරිකර මාසිකව බැංකුවට දැමූ මම පිළිවෙළට ක්‍රමයෙන් වැඩිකරමින් දැන් දිනකට 1008 බැගින් ඉතුරු කර වෙනමම ගිණුමකට තැන්පත් කරමින් සිටියි. එම මුදල යළි ස්ථිර තැන්පතු කරන බැවින් එයටද වැඩි පොළියක් එකතු වන නිසා මාසිකව මම තැන්පත් කරන මුදල මෙන් තව ගුණයක් එක් වී ඇත. $1008^2$ වැඩි වී (එනම් දෙගුණයකටත්) වැඩි මුදලක් මාසිකව මට දැන් ඉතිරිකිරීමට හැකිවී ඇත. ප්‍රතිඵල ලද විගස දුරකථනයෙන් ඔබතුමාට දැනුම් දුනෙමි. මේ සමග ඔබ මට කියූ පරිදි ලිඛිත දැනුම්දීමක් මෙත්සවිය කාර්යාලයටද ගෙන ගොස් භාර දෙමි. වැඩි විස්තර අවශ්‍යනම් සියලුම විස්තර ඔබතුමාට ලබා දෙමි.

භව ගමන ඉතා අනාරක්ෂිත හා භායනක බව නිතරම මට සිතේ. මීළගට කුණ්ඩලිනි යෝග ක්‍රමය කිරීමට කැමැත්තෙන් සිටිමි. ළග නොසිටියත් ඔබතුමාගේ ආශිර්වාදය සහ මගපෙන්වීමක් ලැබේවායි පතමි. අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ ඔබතුමා ඇතුලු කාර්ය මණ්ඩලයටත් සියලුම සාමාජික සාමාජිකයන්ටත් තෙරුවන් සරණයි!

මෙයට විශ්වාසී

P. M. Senadeera

පී එම් සේනාධීර
සාමාජික අංකය 11-2014

# මෙත් සවියට මල් මිටක්

සුරේෂානි මුතුමාලි,
1099/2 ලියනගොඩ
තන්තිරිමලය,
5-10-2018

ගරු සභාපති තුමා,

මේ ලිපිය ලියන්නේ සුරේෂානි මුතුමාලි දරුවාගේ මිත්තනියයි. මේ දරුවාට ලැබුනු ශිෂ්‍යත්ව අරමුදලට ස්තූතියි. අරමුදලට පිහිටවූ, මහත්මා හෝ මහත්මියට උතුම් පිනකි.

දෙමාපිය දෙදෙනාම නොමැති මේ අගහිගකම් මැද්දේ සිටි මට දරුවාගේ ඉගෙනීමේ කටයුතු සඳහා කල උපකාරයට බොහෝ අගය කොට සලකමි. ඔබ සැමට බොහෝ පින.

මෙයට
මිත්තනිය
ඇන් ඇලි ජයවතී

---

කිය මවදනින් නොකියූ වදන්
නිරතුරු අප දුරුවන් කලේ
චන්දන මැතිණිය ඔබේ ලෝ හැඩ
ඉසිවර ධබසි සිරි ලක්බිමේ

ජීවිතයේ බොහෝ තැන ඇති වූවා.
නියතම වූ මා දුක් වූවා //
සැනසිලි වදනින් මා සිත සනසා
මෙත් සවි මග පෙන්නා දුන්නා
ඔවුන් වඩා සිත් නිවනා පින් මග
කරුණා ගුණයෙන් මට කීවා //
සුව මනසක් පෙන්නා දුන්නා - ඉසිවර ධබසි සිරි ලක්බිමේ
මහසුරු තුමා කරු සක්වලේ
ඔබ කාටත් මහෙම කවයි - අපි කාගෙත් දෙවියෙක් වගෙයි.
තිසරණ සරණින් සැම දෙවි පිහිටෙන්
චන්දන මැතිණියන් සුරකේවා! //
මෙත් සවි සැමදෙන සුරකේවා!
දොහොත් මුදුන් දී වඳිනෙමු සැම දින
මහ සඟ රුවනත් සුරකේවා!

යසෝන්ද රණවක

---

චන්දන ජයරත්න ගුරුතුමණි.

වසර කීපයක සිට මම මෙත්සවිය භාවනා වැඩසටහනට සහභාගී වන්නෙමි. මා මෙම භාවනා වැඩසටහනට සහභාගී වන කාලයේ මට විවිධ ප්‍රශ්න, ගැටළු, පීඩා තිබූ අතර හිරිහැර, කරදර නින්දා, අපහාස, වින්න පීඩා බොහෝ තිබුනා.

මම බොහෝ හොඳ කෙනෙකු යැයි, මට අන් අය නිකරුණේ හිරිහැර කරන්නේ යැයි සිතමින් මා ඔවුන් හා නිතරම ගැටුනෙමි. එමෙන්ම මාගේ සමීපතයන් පිළිබඳව කළකිරීමක්, නොරිස්සුම් සහගත හැඟීමක් මසිතේ තිබුනා.

චන්දන ගුරුතුමණී වසර කීපයක් මම මෙත්සවිය සමග කටයුතු කරද්දී භාවනා භාවනා පන්ති වලට සහභාගී වෙමින් ඔබතුමියන් දේශනා කරන හොඳින් ප්‍රගුණ කළෙමි. නිතරම සියලු දෙනාටම මෙත් වැඩුවෙමි. ඇසුරු කරන සැමදෙනාටත්, මා සමග ගැටෙන තරහ කරන සැමදෙනාටමත්, සතා සිවුපාවුන්ට පවා මෙත් වඩින අතර සසර ගමනේදීත්, මේ භවයේදීත් දැනගෙන නොදැන මගෙන් ඔවුන්ට සිදුවී ඇති සියළු වැරදි වලට හදවතින්ම දෙපා නැමද සමාව ගත්තෙමි. ගත්තෙමි.

මගේ සිත නිතරම දුක් පවසන්නේ සංසාර ගමනේදී මා බොහෝ දෙනෙකු සමඟ ගැටී ඇති බවයි. බොහෝ දෙනෙකුට හිරිහැර කර ඇති බවයි. ඒ පිළිගැනීමම, ඒ අවබෝධයම මට කර්ම න්‍යායෙන් ගැලවීමට උපකාර වී යැයි මට සිතේ. එමෙන්ම ගුණ 5 වැඩීමද, මා ලෙඩවන බවද මරණයට පත්වන බව ද, අපලේ දහම සැමට පොදු බවද, මේ ශරීරයේ නිස්සාර බවද, ගුරුතුමා විසින් බුද්ධ වන්දනයේ සිට භාවනාව දක්වා කියාදුන් සියල්ලම කරුණුද, මා අදවන විට ගතකරන සැහැල්ලු, නිදහස්, ප්‍රශ්න ගැටළු වලින් තොර, සතුටින් සැනසීමෙන් පිරි සාර්ථක සමාජ ජීවිතයේත්, විවාහ ජීවිතයේත් මෙන්ම ආධ්‍යාත්මික ජීවිතයේද දියුණුව බව මම හොඳින් දනිමි

සතතයෙන්ම බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය මා අවබෝධකරගත්තේ, හදවතින්ම තෙරුවන් සරණ ගියේ සැබෑ බෞද්ධයෙකු වුයේ ගුරුතුමණි ඔබතුමාඉන් උගන්වන ප්‍රායෝගිකව පුහුණු කරමින් ... ත්‍රිවිධ රත්නයට මාතුමවින් ... නිතරුම මට උපකාරකරන බව මම හොඳින් දනිමි.

ගුරුතුමණි ලෞකික සමාජය ප්‍රශ්න, ගැටළු ලෙස දකින බොහෝ දේ මා අසලට පැමිණ ඇවිත්, පැමිණි, නැවතී යන්නේ යැයි මට සිතේ. මම මගේ සිත ඉවත්කර ගනිමින් සිටිමි. උතුම් වූ ගුරුතුමණි ඔබතුමා විසින් කියාදුන් පෙනුම බුද්ධානුස්සතිය භාවනාවේ ... නිතරම පිළිපදිමින්, මෙනෙහිකරමින්, නිතරම ප්‍රායෝගිකව පුහුණු කරමි.

මහා පිරිත්ද නිතරම මම හදවතින්ම සියලු සත්ත්වයන්ට මෙත්වඩමි ගුණ භාවනාවෙන්, මෙත් සිත වැඩීමෙන්, සියලු සත්වයන්ට මගෙන් සිදුවී ඇති වැරදි වලට සමාව ගැනීමෙන්, සිතේ රැඳී ඇති අතීත සිදුවීම් කරනුව වෛරය ප්‍රවාහ දැමීමෙන්, මා දෙසම බලබලා පිරිසිදුවීමට උත්සාහ දැරීමෙන්... විශේෂයෙන්ම කර්ම න්‍යායෙන් මා නිදහස් කරමින් සිටින්නේ යැයි මට සිතේ.

ශාන්ත ගුරුතුමණී, මමමෙන්ම මේ විශ්වයේ සිටින සියළු සත්ත්වයන්ට සසර දුකින් මිදීමට මෛත්‍රිය දරන සියළු සත්ත්වයන්ට උතුම් වූ ඔබේ ආශිර්වාදය මටමෙන්ම හිමිවේවා සී! ජනා අතර චන්දන ජයරත්න ගුරුතුමණි මේ පින කුසලය උතුම් වූ ඔබේ ලෞකික, ලෝකෝත්තර සියළු අරමුණු සාර්ථක කරගැනීම පිණිස ඒකාන්ත වශයෙන්ම හේතුවාසනා වේවා! පතමි.

මෙත්සවිය සාමාජිකා

# අෂ්ට ලෝක ධර්මය

" ලාභො අලාභො අයසෝ යසෝ ච
නින්දා පසංසා ච සුඛං ච දුක්ඛං
එතේ අනිච්චා මනුජේසු ධම්මා
අසස්සතා විප්පරිණාම ධම්මා "

ලාභය, අලාභය, යසස ය, අයස ය, නින්දාව ය, ප්‍රශංසාව ය, සැපය ය, දුක ය යන මේ ධර්ම අට ලෝක ධර්ම යයි කියනු ලැබේ. මෙලොව වෙසෙන සෑම මිනිසකු කරා ම ඒ ධර්මයෝ වරින් වර පැමිණෙති. චක්‍රයක් සේ කැරකෙන ඒ ධර්මයන් ගේ පැමිණීම අවස්ථාවෙන් අවස්ථාවට සිදුවන නිසා සාමාන්‍ය මිනිසකුට තබා සිටුවරයෙකුට රජ කෙනෙකුට වුවද සෑම කල්හි එක් තත්ත්වයෙන් ම වාසය කරන්නට නොලැබේ.

ලෝක ධර්මයන් අතුරෙන් ලාභය යනු ආහාර පාන වස්ත්‍ර මිල මුදල් ආදිය ලැබීමය. අලාභය යනු ලැබූ දෑ නැති වී යෑම හා ඉදිරියට නොලැබී යෑම ය. කලෙක බොහෝ ලාභ ඇති ව පොහොසත්ව සිටින තැනැත්තා කරා කලදී අලාභය පැමිණෙන්නේ ය. කලක් අලාභයෙන් හෙවත් දිළිඳු කමින් පීඩිත තැනැත්තා කරා කලෙක ලාභය පැමිණෙන්නේ ය. මෙසේ මිනිසාට ලාභ ලාභ දෙක චක්‍රයක් සේ කැරකෙන්නේ ය.

යසස යනු තමා හා එක් ව හැසිරෙන තමාගේ කටයුතුවලට සහභාගී වන පිරිසය. අයසය යනු එබඳු පිරිසක් නැති බව ය. කලෙක මහ පිරිසක් ඇති ව සිටි තැනැත්තා කලෙක මඳ පිරිසක් ඇතියෙන් හෝ තනි වූවෙක් හෝ වේ. තමා අනුව හැසිරෙන කිසිවෙකු නැතිව තනි ව සිටි තැනැත්තා හට කලෙක මහපිරිස් ඇති වේ. මෙසේ දෙ චක්‍රයක් සේ මිනිසා කරා වරින් වර පැමිණේ. කීර්ති අපකීර්ති දෙකට ම යසඅයස යයි කියනු ලැබේ.

කලෙක බොහෝ දෙනාගෙන් ගැරහුම් ලබමින් විසූ තැනැත්තා කලෙක බොහෝ දෙනාගෙන් පැසසුම් ලබන්නේ ය. කලෙක පැසසුම් ලැබූ තැනැත්තා නැවත කලෙක ගැරහුම් ලබන්නේ ය. මෙසේ නින්දා ප්‍රශංසා දෙක වරින් වර මිනිසා කරා පැමිණේ.

කලෙක සැප සේ විසූ තැනැත්තා කරා කලෙක දුක් පැමිණෙන්නේය. කලෙක දුකින් සිටි තැනැත්තා කරා කලෙක සැප පැමිණෙන්නේය. මෙසේ සුව දුක් දෙක වරින් වර මිනිසා කරා පැමිණේ.

ලෝක ධර්මයන්ට අනුව පෙළෙන මිනිසා විසින් ඒවා පිළිබඳ මනා දැනුමක් ඇතිව විසිය යුතුය. ලෝක ධර්මයන්ගේ තතු නොදත් නුවණ මඳ පුද්ගලයා ලාභය ය, පිරිවර ය, ප්‍රශංසාව ය, සැපය ය යන අෂ්ට ලෝකධර්මයන් ලබා සිටින අවස්ථාවේ දී ඒවා නිසා උඩගු වී තමා උසස් කොට ද අන්‍යයන් පහත් කොට ද සිතති. ඒවායින් මත් ව නොයෙක් නො මනා කම් කොට දෙලොවින්ම පිරිහෙති. අලාභය ය, පිරිස් නැති බවය, නින්දාව ය, දුකය ය යන නොමනා ධර්මයන්ට මුහුණ පාන්නට වූ අවස්ථාවේදී බොහෝ තැවෙන්නේය. අන්‍යයන්ට වෛර කරන්නේය. අන්‍යයන්ට ඊර්ෂ්‍යා කරන්නේය. එසේ කොට දෙලොවින් ම පිරිහීමට පැමිණෙන්නේය. ලෝක ධර්මයන්ගේ සැටි තේරුම් ගත් තැනැත්තා විසින් ලාභාදිය ලබා සිටින අවස්ථාවේ දී ඒවායේ ඇති අස්ථිර ස්වභාවය පෙරලෙන ස්වාභාවය සලකා උඩගු නොවන්නේය. මත් නොවන්නේය. ලාභාදිය ඇතියන්ට ක්‍රෝධ, ඊර්ෂ්‍යා නො කරන්නේය. දුප්පත්කම නිසා නො මනාකම් නො කරන්නේය. තමා පහත් කොට ද නොසිතන්නේය. ලාභාදිය ඇතිවුන් උසස් කොට ද නොසිතන්නේය. මෙසේ ලෝක ධර්මයන් ගැන මැදහත් ව සිතන නුවණැති මිනිසා දෙලෝ වැඩ සිදුකර ගන්නේය. ලෝක ධර්මයන් කෙරෙහි සම ව පැවැත්ම උසස් අදහස් ඇති උත්තම පුද්ගලයන් ගේ ස්වභාවයකි. ලෝක ධර්මයන් නිසා උඩගු වීම හා ශෝක කිරීම හීනයන්ගේ ස්වභාවයකි.

## ලෝක ධර්මයන් කෙරෙහි සැලකිය යුතු කරුණු

" ධම්මේන ච අලාභො යො
යො ච ලාභෝ අධම්මිකො
අලාභො ධම්මිකෝ සෙය්‍යො
යං චෙ ලාභෝ අධම්මිකො "

" ධර්මයෙන් වන්නා වූ අලාභය සහ අධර්මයෙන් වන්නා වූ අලාභය ය යන මේ දෙකින් අධර්මයෙන් වන අලාභයට වඩා ධාර්මික අලාභය ම උතුම් ය " යනු එහි අදහසයි.

" යසෝ ච අප්පබුද්ධීනං
විඤ්ඤූනං අවසො ච යො
අයසො ච සෙය්‍යො විඤ්ඤූනං
න යසො අප්පබුද්ධිනං "

" මන්දබුද්ධිකයන් නිසා වන කීර්තිය ය, නුවණැතියන් නිසා වන අපකීර්තිය ය යන දෙකින් මන්දබුද්ධිකයන් නිසා ලබන කීර්තියට වඩා නුවණැතියන් නිසා ලබන අපකීර්තිය ම උතුම් ය " යනු එහි අදහසයි.

" දුම්මෙධෙහි පසංසා ච
විඤ්ඤූහි ගරහා ච යා
ගරහා ච සෙය්‍යො විඤ්ඤූං
යං චෙ බාලපස්සංසනා "

" අඥයන් විසින් කරන ප්‍රශංසාව ය, විඥයන් විසින් කරන ගර්හාවය යන දෙකින් බාලයන්ගේ ප්‍රශංසාවට වඩා විඥායන්ගේ ගර්හාව ම උතුම් වන්නේය " යනු එහි අදහසයි.

" සුඛං ච කාමෙමයිකං
දුක්ඛඤ්ච පවිවෙකියං
පවිවෙකියං දුක්ඛං සෙය්‍යො
යං චෙ කාමමයං සුඛං "

" කාමසුඛය ය, විවේකයෙන් වන දුක ය යන දෙකින් කාම සුඛයට වඩා විවේකයෙන් වන දුක ම උතුම් ය" යනු එහි තේරුමයි.



# කොහොමද සිගරට්වලින් නිදහස් වෙන්නේ ?

## හරිම සරලයි

**නවත්වනවා කියලා හිතුවා නවත්තලා දැම්මා.** සමහර අයට එහෙම කරන්න අපහසු වෙන්න පුළුවන්. **එහෙම අපහසු අයට අපි කියන්නද ලෙහෙසි පියවර කිහිපයක්...**

### 1 වෙනි පියවර -



නැවැත්වීම සඳහා දිනයක් යොදාගන්න.

### 2 වෙනි පියවර -



ඔබගේ තීරණය ක්‍රියාත්මක කිරීමට ඔබට උපකාර කරන අය සමග කතාබහ කරන්න.

එයාලට කියන්න ඔබ සිගරට් බොන එක නවත්වනවා කියලා. විශේෂයෙන් ම ඔබේ බිරිඳට දරුවන්ට සහ යාළුවන්ට

### 3 වෙනි පියවර -



ඉදිරියේ ඇති විය හැකි ගැටලු ගැන හිතන්න. සිගරට් බොන එක නවත්වන්න යනකොට තවමත් සිගරට් බොන අයගෙන් වෙන්න පුළුවන් බලපෑම ගැන හිතන්න.


විශේෂයෙන් උත්සව අවස්ථාවල හැසිරෙන ආකාරය ඔබ සැලසුම් කරගන්න. එහි දී කළ හැකි දේවල් ගැන යහළුවන් එක්ක ටිකක් කතා කරන්න. ඔවුන්ගෙන් උපදෙස් ගන්න. ඔවුන්ගේ සහයෝගය ලබාගන්න.

### 4 වෙනි පියවර -



ඔබේ මෙම තීරණය දුර්වල කරන, සිගරට් බීමට බල කරන කණ්ඩායමට මුහුණ දීමට සූදානම් වෙන්න. උදාහරණයක් විදිහට **"මම සිගරට් බොන එක නැවැත්තුවා. මට බල කරන්න එපා"** කියලා කියන්න පුරුදු වෙන්න.

### 5 වෙනි පියවර -





නැවත නැවතත් සිගරට් බීමට ඔබ තුළ ඇති කරන දැඩි ආශාව ගැනත් ටිකක් හිතන්න.

### 6. වෙනි පියවර -

සැමවිටම සිගරට්වලින් නිදහස් වීමෙන් සතුටක් විඳින්න. ඒ ගැන කතා කරන්න.

**දැන් ඔබ ගඳ ගහන සිගරට්වලින් නිදහස්...**



# YOUR BLOOD TYPE HOLDS A LOT OF INFORMATION LIKE WHAT YOU SHOULD BE EATING



Unlike most diets, the blood type diet was founded on the concept of personalized nutrition - eating different foods based on one's biochemical makeup. Eat Right 4 Your Type, commonly known as the blood type diet, was published in 1996 by naturopathic doctor Peter J. D'Adamo. According to Eat 4 Your Type, your blood type can provide an analysis on how your body reacts to foods and stress, explain your gut bacteria, and potentially predict your susceptibility for certain diseases.

## HOW DOES THE BLOOD TYPE DIET WORK?

The first step to starting this diet is knowing your blood type (O, A, B, or AB). Once your blood type has been determined, you simply make the necessary adjustments to your diet by following a nutritional plan catered to your blood type.

## TYPE O

This diet focuses on lean organic meats, vegetables, legumes, fruits, and avoiding wheat and dairy, which can trigger digestive and health issues like inflammation and autoimmunity. Because Type Os tend to display the "flight or fight" stress response, causing chemical imbalances, caffeine (which raises adrenaline and noradrenaline levels that are already high) and alcohol should be eliminated. Kelp, seafood, red meats, kale, and spinach are all beneficial to those with Type O blood. High-intensity exercise like running is also advised. People with O blood type may be predisposed to certain illnesses like ulcers and thyroid disorders, and tend to have higher levels of stomach acid. Type Os are able to easily digest proteins and fats, due to a higher secretion of two chemicals present in the digestive tract-intestinal alkaline phosphatase and a lipoprotein called ApoB48.

## TYPE A

People with Type A blood handle carbohydrates very well. They have lower levels of hydrochloric acids in the stomach and an ability to efficiently digest carbohydrates. It can be harder to digest and metabolize animal protein and fat. Type As tend to have naturally high levels of stress and flourish on a vegetarian diet, due to toxin elimination causing higher energy levels as a result. Consuming foods that are fresh and organic paired with calming exercises are great for those who have Type A blood.

## TYPE B

Those with blood Type B will thrive as a "balanced omnivore," eating meat, low-fat dairy, grains, legumes, fruits, and vegetables. With a lot of food flexibility, it is advised to avoid chicken, replacing it with meats like lamb and venison. Moderate exercise with a mental component like hiking or cycling are also recommended. Those with Type B blood tend to producer higher than normal cortisol levels when it comes to stress, have a sensitivity to B-specific lectins in certain foods that can lead to inflammation, and are susceptible to "slow growing lingering viruses" and autoimmune diseases. Corn, wheat, buckwheat, lentils, tomatoes, peanuts, and sesame seeds can cause weight gain for those with Type B blood. These foods affect the metabolic process which can lead to fluid retention, fatigue, and hypoglycemia.

## TYPE AB

Having type AB blood is so rare, it's found in less than 5 percent of the population. Type AB are codominant and face both the benefits and challenges of Types A and Types B. A mixed diet works best for those who are Type AB, eating foods like lamb, dairy, grains, vegetables, and fruits. A combination of calming and moderate exercise is great for those who are Type AB. Small, frequent meals help with digestive problems due to low stomach acid. Caffeine and alcohol should also be avoided, particularly when under stress.

## THE VERDICT

This diet seems to be a great fit for those who are looking to optimize how they feel on a daily basis. While some blood types seem to have more restrictions than others, it's worth trying if it can help you look and feel your best in the years to come! As always, speak to your doctor before making any significant changes to your diet.

| Blood Type | Characteristics | Best Foods | Worst Foods | Foods that Aid this Blood Type the Best |
|---|---|---|---|---|
| Type O | Known to have strong immune and digestive systems, type Os also have efficient metabolisms and are naturally hardy against illnesses. | High protein foods (lean meat and fish), legumes, pulses, soy, nuts (cashews, pecans, all-natural peanut butter), yellow & red vegetables and fruits | Wheat, corn, kidney beans, navy beans, lentils, cabbage, brussels sprouts, cauliflower | Kelp, seafood, salt, liver, red meat, kale, spinach and broccoli |
| Type A | Those with type A blood can adapt well to dietary and environmental changes. They generally have a good immune system, and are able to metabolize nutrients easily. | Type A's will best benefit from a vegetarian diet that includes a wide array of vegetables, as well as tofu, seafood, grains, beans, legumes and fruit. | Most types of meat; dairy, kidney beans, lima beans, wheat | Vegetable oil, soy-based foods, vegetables and fruits, particularly pineapple. |
| Type B | Have strong immune systems; can adapt readily to dietary and environmental changes; known to have balanced nervous systems | Meat (no chicken), dairy, grains, beans, legumes, vegetables and fruit. | Corn, lentils, peanuts, sesame seeds, buckwheat and wheat | Dark leafy greens, eggs, venison, liver, licorice and tea |
| Type AB | Type ABs have extremely efficient tolerant immune systems. They are technically a combination of the benefits of both A and B blood types. | Lean meat (in moderation), seafood, dairy, tofu, beans, legumes, grains, vegetables and fruit | Red meat, kidney beans, lima beans, seeds, corn and buckwheat | Tofu, seafood, dairy, greens, kelp, seaweed (nori), and pineapple |

*Source: www.WebMD and POPSUGAR Fitness*

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

# ශිෂ්‍යත්ව අයදුම් පත්‍රය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 071 401 4467, 011 250 5088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org

ශිෂ්‍යයාගේ උඩුකය පිංතූරය

01. සිසුවාගේ සම්පූර්ණ නම :......................................................................

......................................................................

02. පදිංචි ලිපිනය :......................................................................

:......................................................................

03. උපන් දිනය :......................................................

04. පාසල් යන්නේ නම්, ඉගෙන ගන්නා පාසල :......................................................

......................................................ශ්‍රේණිය......................

05. මවගේ නම :...................................................... දු:ක: අංකය :......................

ජීවත්ව සිටී ද :...( ඔව් / නැත )......... ඇයගේ රැකියාව :......................................

රැකියාව කරනා ස්ථානයේ ලිපිනය :......................................................................

06. පියාගේ නම :...................................................... දු:ක: අංකය :......................

ජීවත්ව සිටී ද :...( ඔව් / නැත )......... ඇයගේ රැකියාව :......................................

රැකියාව කරනා ස්ථානයේ ලිපිනය :......................................................................

07. පවුලේ මාසික ආදායම රුපියල් ......................................................................

08. ඔබ විසින් වෙනත් ශිෂ්‍යත්ව/ ශිෂ්‍යාධාර ලබා ගන්නේ නම් හා / හෝ අතීතයේ ලබා ගත්තේ නම් ඒ පිළිබඳ විස්තර

:......................................................................

:......................................................................

09. සම්පත් බැංකුවේ ගිණුම් අංකය සහ ශාඛාව :

| ගිණුම් හිමියාගේ නම | ගිණුම් අංකය | ශාඛාව |
|---|---|---|
| | | |
| | | |

(ගිණුම් හිමියාගේ බැංකු පොතේ මුල් පිටුවේ ඡායා පිටපතක් අමුණා එවන්න) **වෙනත් බැංකු සඳහා කාර්යාලයෙන් විමසන්න.**

**මා විසින් ප්‍රකාශ කළ ඉහත සඳහන් සියලු තොරතුරු මා දන්නා පමණින් සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි.**

අත්සන :......................................

**(සැලකිය යුතුයි - මෙහි ඇති සියලුම කරුණු සම්පූර්ණයෙන්ම පුරවා එවිය යුතුය. නැතහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)**

ඊළඟ පිටුව →

## විහාරස්ථානාධිපති ස්වාමීන් වහන්සේගේ නිර්දේශය

..................................................................................................................................................

විහාරස්ථානයේ ඉහත සඳහන් ශිෂ්‍යයා / ශිෂ්‍යාව අප පන්සලට අයත් සීමාව තුළ ජීවත් වන බවත් / ඉරුදින දහම් පාසලේ ශිෂ්‍යාවක / ශිෂ්‍යයෙකු වන බව / නොවන බවත් හා ශිෂත්වයක් සඳහා සුදුසු බවත් දන්වමි.

විහාරාධිපති නිල මුද්‍රාව :........................................................................ දිනය :..................................................

## විදුහල්පතිතුමා / විදුහල්පතිතුමියගේ නිර්දේශය

..................................................................................................................................................

විද්‍යාලයේ ඉහත නම සඳහන් ශිෂ්‍යයා / ශිෂ්‍යාව අපගේ පාසලේ ........................................ වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර සපයා ඇති තොරතුරු සත්‍ය බව ද දන්වමි. මා දන්නා පමණින් ඇයට / ඔහුට වෙනත් ආධාර මුදලක් නොලැබෙන බවත් ප්‍රකාශ කරමි. ඇය/ ඔහු ශිෂ්‍යත්වයක් සඳහා සුදුසු යැයි නිර්දේශ කරමි.

විදුහල්පති නිල මුද්‍රාව :.................................................... පන්ති භාර ගුරුතුමිය :....................................................

## තොරතුරු සත්‍ය බවට මෙත් සවිය සාමාජිකයකු විසින් නිවසට ගොස් පරීක්ෂා කර බලා කරනු බලන නිර්දේශය

මෙත් සවිය සාමාජික අංකය ...................................... නම ..................................................................
වන මා ඉහත සඳහන් දරුවාගේ තොරතුරු සත්‍ය වන බව හා ශිෂ්‍යත්වයක් ලබා දීම සුදුසු / නුසුදුසු යයි නිර්දේශ කරමි.

අත්සන :........................................................................ දිනය :..................................................

## මෙත් සවිය කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ශිෂ්‍යත්වය ප්‍රදානය කරන්නා ........................................................................................................ මයා / මිය.

දු. ක :.................................................................. හඳුන්වා දුන් අංකය :..................................................

ශිෂ්‍යත්වය ආරම්භ වන දිනය :.................................................... අවසාන වන දිනය :..........................................

මාසිකව ප්‍රදානය කිරීමට නිර්දේශිත මුදල රු. :.................................................................................. කි.

පරිපාලන නිලධාරී :..................................................

**මෙත් සවිය අසරණ සරණ කමිටු සභාපතිගේ/ මෙත් සවිය ලේකම්ගේ අනුමැතිය - අනුමත කරමි / නොකරමි**

**තනතුර** :..................................................

**මෙත් සවිය නිර්මාතෘ හා සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ අනුමැතිය - අනුමත කරමි / නොකරමි**

**සභාපති - මහාචාර්ය චන්දන ජයරත්න මහතා** :..................................................

# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දිම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න. (011-2505088, 0714-014467).** එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මගින්ද තොරතුරු ලබා ගත හැකිය.
මීට අමතරව මංජුල පත්මකුමාර මහතා (දු.ක : 071 529 5855) හෝ පියල් චන්ද්‍රතුංග මහතා (දු:ක: 0714 501 358) අමතා ද හදිසි තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මගින් **දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 42 වන භාවනා වැඩසටහන

**42 වන භාවනා වැඩසටහන 2019 ජූලි මස 21 ඉරු දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2019/07/14 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.**

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 37 වන වැඩමුළුව

**ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 37 වන වැඩමුළුව 2019/08/11 දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 37 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2019/08/04 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.**


### දෙමළ භාෂාව

පාසල් යන දරුවන් සඳහා
දෙමළ භාෂාව ඉගැන්වීම කරනු ලැබේ.
නිවසට පැමිණ හෝ
විජයාරාම විහාරස්ථානයේ දී
සෑම ඉරුදිනක ම
ප.ව. 2.00 - 4.00 දක්වා පැවැත්වේ.
**දුරකථන : 0714486680**
මෙත්සවිය සාමාජිකා - ආලෝකා කුමාරි - 19-3086

### ගණකාධිකරන හා මුල්‍ය සේවා

පලපුරුදු, වෘත්තීය ගණකාධිකාරිවරයෙකු වන
මෙත්සවිය සාමාජිකයකු තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර,
සමාගම් ඇතුළු සියලූ ව්‍යාපාරවල විගණනය,
ගිණුම් පිලියෙලකිරීම්,
ආදායම් බදු හා මුල්‍ය කළමනාකරණ උපදෙස් හා
සේවාවන් සාධාරණ ගාස්තු යටතේ සපයනු ලැබේ.
**විස්තර : 077 2355117 අමතන්න.**

### දිදුලක ක්‍රියේෂන්ස්

විසිතුරු නිර්මාණ සමගින් අලංකාරවත් ලෙස
**මුතුකුඩ නිර්මාණය**
මනාලියන්ගේ සහ උත්සව අවස්ථාවන් සඳහා
**සාරි නිර්මාණය කරනු ලැබේ**
**සාමාජිකා - දිලිනි**
බොරලැස්ගමුව - **0773904405**

ප්ලාස්ටික් ප්‍රතිශක්තිකරණය කර
පිගන්/ කෝප්ප / වට්ටි ආදිය තැනීම රැකියාව කරගත්
සාමාජිකාවකට (සා.අංක. 34-5228) නැගී සිටිමට අතහිත දෙන්න...
**ඔබ නිවසේ විසිකරන අනවශ්‍ය ප්ලාස්ටික් ද්‍රව්‍ය තිබේ නම්**
පොල්තෙල් බෝතල්/අයිස්ක්‍රීම් පෙට්ටි/ වතුර බෝතල් ආදිය
භාර දීමට විමසන්න - **0772 353 392**

### සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්
**SIGHT 'N' STYLE OPTOMETRISTS**



නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට)
**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)**

**FOR A COMFORTABLE STAY IN ANURADHAPURA** #523/10, Maithreepala Senanayaka Mawatha, Dahaiyagama Handiya, Anuradhapura.
CONTACT : NIHAL FERNANDO - PHONE : 025-2220209, MOBILE : 071-4394481

### මැහුම් කලාව පුහුණු කිරීම



මැහුම් කලාවේ සුන්දරම නිර්මාණය වූ, **රිබන් මෝස්තර නිර්මාණ සහ බ්‍රසීලියන් එම්බ්‍රොයිඩර් පුහුණු කිරීම**. නිවස අලංකාරයට **බිත්ති සැරසිලි, කුෂන් කවර, මේස රෙදි ආදි බොහෝ දෑ සමඟ කුඩා ළමා ඇඳුම් සිට බ්ලවුස් සහ සාරිය දක්වාත්,**
නිවැරදි ලෙස වර්ණ සංකලණය කරමින් සොබා දහමේ සුන්දරත්වය එලෙසින්ම රැකෙන පරිදි
ඉතා සියුම් නිර්මාණ පුහුණු කරනු ලැබේ.
**නිමැවුම් භාර ගැනීම සඳහා ද විමසන්න. 077 542 1001**
(ළමා නිවාසවල දැරියන්ට ශක්තියක් වීමට නොමිලේ පුහුණුව දීමට කැමැත්තෙමි)

# මෙත් සවිය මනස අධ්‍යාපන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

**(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

01. සම්පූර්ණ නම ..............................

02. ස්ත්‍රී / පුරුෂ භාවය .............................. 3. ජාතික හැඳුනුම්පත් අංකය ..............................

(ඡායා පිටපතක් අමුණන්න)

04. උපන් දිනය .............................. 5. වයස .............................. 6. ආගම ..............................

07. ස්ථිර ලිපිනය ..............................

විද්‍යුත් තැපෑල (e-mail) .............................. දු:ක: නිවස .............................. ජංගම ..............................

08. දිස්ත්‍රික්කය .............................. 9. විවාහක / අවිවාහක බව ..............................

10. දරුවන් සිටිනම් විස්තර : ගැහැණු දරුවන්ගේ වයස් .............................. / පිරිමි දරුවන්ගේ වයස් ..............................

11. රැකියාව හා තනතුර ..............................

ආයතනයේ නම ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ..............................

12. .............................. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර

13. .............................. ලිපි එවිය යුතු ලිපිනය

14. .............................. ලබා ඇති ඉහළම

අධ්‍යාපනික සුදුසුකම්,

1. ..............................

15. 2. ..............................

වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,

1. ..............................

2. ..............................

16. 3. ..............................

ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ

17. විස්තර ..............................

18. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.

19. ..............................

ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ..............................

..............................

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .............................. අයදුම්කරුගේ අත්සන ..............................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ..............................

.............................. ..............................

තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ..............................

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශන, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 2,500 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 1,500 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරිතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත් බව දැන්වූවාට පසුව පමණක් සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය අඟහරුවාදා, බදාදා හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමඟ පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමඟ කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)


ලිපිනය :- ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ 06, දුරකථන : 0112 505088, 0714 014467, www.methsaviya.org

**සියළු සාමාජිකයින් සඳහා නොමිලේ පැවැත්වෙන ආධ්‍යාත්මය දියුණු කිරීමේ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වලට අමතරව ධර්ම දේශනා, විශේෂ දේශන, සාර්ථකව ඉගෙන ගන්නා අන්දම පිළිබඳ වැඩමුළුව, අක්ෂි සායන, වෛද්‍ය සායන වලට සහභාගී වීමට අවස්ථාව සහ පුස්තකාල පහසුකම් හිමිය. මෙත් සවිය සඟරාව නිවසටම තැපෑලෙන් එවන අතර වාර්ෂික දින දර්ශනය ද නොමිලේ මෙත් සවිය මගින් ලබා දේ. මියගිය සාමාජිකයින් සඳහා වාර්ෂිකව සංඝගත දක්ෂිණාවක් පවත්වා පිං අනුමෝදන් කිරීම ද සිදු කෙරේ.**

# මෙත් සවිය

2019 ජුනි මස

## සඟරාව මුද්‍රණය සඳහා බැතිබර දායකත්වය




**2018.11.23 වන දින පරලෝ සැපත්**

මෙත් සවිය සාමාජිකා
20-3278

## සවිත්‍රි වික්‍රමසිංහ

මහත්මියට පිං පිණිස



**සඟරාවේ සම්පූර්ණ මුද්‍රණ පිරිවැය සඳහා පවුලේ සාමාජිකයින් විසින් දායකත්වය ලබා දී ඇත.**

ඇය විසින් රෝගාතුරව සිටියදී,

මහියංගනය රාජමහා විහාරස්ථානයේ ඉදිවෙමින් පවතින බුද්ධ ප්‍රතිමා වහන්සේ සඳහා **රු. 100,000/-** පරිත්‍යාග කරන ලදී.

බුද්ධ ප්‍රතිමාවේ තැන්පත් කිරීම සඳහා **රු. 100,000/-** වටිනාකමින් යුත් තමන් සතු රන් ආභරණ වලින් නිමකරන ලද පෙනහැල්ලක ආකෘතියක් පූජා කරන ලදී.

**ඇය විසින් එක් රැස් කරගන්තා වූ සියළු කුසල් උතුම් වූ නිර්වාණාවබෝධය පිණිසම හේතු වාසනා වේවා!යි මෙත් සවිය සියළු දෙනා විසින් පුණ්‍යානුමෝදනා කර සිටිමු.**

අසරණ සරණ සඳහා සහ
මරණයට කැපවූ සහ හිරකළ සතුන්
නිදහස් කිරීම සඳහා



**තරුණ කමිටුවේ දායකත්වයෙන් සාමාජිකයින් හට නොමිලේ පිං කැට බෙදාදීම.**












මහාචාර්ය චන්දන ජයරත්නයන් විසින් නුගේගොඩ කන්දවත්ත ශ්‍රී විජයවර්ධනාරාමයේ දී පොසොන් පොහෝ දින පවත්වන ලද දේශනය





මහාචාර්ය චන්දන ජයරත්නයන් විසින් කඳුබොඩ බවුන් සෙත් අරණ භාවනා මධ්‍යස්ථානයේ දී පොසොන් පොහෝ දින පවත්වන ලද දේශනය










අතිපූජ්‍ය අහංගම ආනන්ද නාහිමිපාණන්වහන්සේ අපවත් වී වසරක් සපිරීම නිමිතිකොට 2019 අප්‍රේල් මස 7 වන දින බොරැල්ල රිජ්වේ ආර්යා ළමා රෝහලට අත්‍යවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය පරිත්‍යාග කරන ලදී.



එදිනම මහා සංඝරත්නය විෂයෙහි සංඝගත දක්ෂිණාවක් සිදුකොට අතිපූජ්‍ය අහංගම ආනන්ද නාහිමියන්ට පිං පැමිණවීම.



2019 අප්‍රේල් මස 7 වන දින ධර්ම දේශනාවක් සහ මෙත් සවිය මහ සමුළුව පැවැත්වීම



2019 ජනවාරි 1 වන දින වසරේ පළමු හීල්දානමය පිංකම කොළඹ ගංගාරාම විහාරස්ථානයේ දී පැවැත්වීම.



2019 ජනවාරි 1 වන දින ජයන්ති ළමානිවාසයේ දූදරුවන් වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම.



වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ මෛත්‍රී බෝධිසත්ව ප්‍රතිමාව ස්ථාපනය කර වසරක් සපිරීම නිමිතිකර පූජා පැවැත්වීම.

# ත්‍රෛමාසික සඳහම් චාරිකාව

2019 පෙබරවාරි 03

පූජ්‍ය

රත්මල්කන



































# මඩවල උපාලි හිමි වැඩවසන ඇල්ල, කිතල් ඇල්ලහි,

# ද විපස්සනා භාවනා මධ්‍යස්ථානය











**මහියංගනය රාජමහා විහාරයේ ඉදිවන බුදුපිළිමවහන්සේ නෙළීම අධීක්ෂණය කිරීම...**








2019 මාර්තු 03 වන දින කොළඹ, බොරැල්ල තරුණ බෞද්ධ සංගම් (Y.M.B.A) ශාලාවෙහි පැවැත් වූ,



# 2019 සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන ක්‍රම පිළිබඳ වැඩමුළුව



































011 2827044 / 0712 285 680